NILIS

# පුස්තකාලයාධිපතිත්ව උසස් සහතිකපත්‍ර පාඨමාලාව

## Advanced Certificate in Librarianship (පාඨමාලා කේතය: ACL)

ACL 2022/2023

### 1) හැඳින්වීම

පුස්තකාලයාධිපතිත්ව උසස් සහතිකපත්‍රය (ACL) ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) 02 මට්ටමට අනුකූලව පිරිනමනු ලබන අතර, සහභාගිවන්නන්ගේ පුස්තකාලයාධිපතිත්ව දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම අරමුණු කර ගෙන සැලසුම් කර ඇත. ACL පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීම අපගේ (SLQF 3 මට්ටමෙහි) ඩිප්ලෝමා පාඨමාලාවකට ඇතුලත්වීමට සුදුසුකමක් ලෙස ද සැලකේ.

### 2) ඉලක්ක කණ්ඩායම

පුස්තකාල ක්ෂේත්‍රය පිළිබඳ මඳ හෝ පූර්ව දැනුමක් ඇති සහ/හෝ ශාස්ත්‍රීය හෝ වෘත්තීය පසුබිමක පූර්ව විධිමත් පුහුණුවක් ලබා නොමැති අය.

### 3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්

පාඨමාලාවට ඇතුළත් වීමට අවශ්‍ය අවම සුදුසුකම

- **අ.පො.ස.(සා.පෙළ) (පැරණි විෂය නිර්දේශය):** මව් භාෂාව සහ ගණිතය ඇතුළුව මූලික විෂයයන් හයක් සමත් වීම සහ අවම වශයෙන් (ඕනෑම) විෂයයන් තුනක් සඳහා සම්මාන සාමාර්ථ (C) හෝ ඉහළ ශ්‍රේණි ලබා තිබීම.
- **අ.පො.ස.(සා.පෙළ) (2007-නව විෂය නිර්දේශය)**: මව් භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයක් සමත් වීම සහ අවම වශයෙන් (ඕනෑම) විෂයයන් තුනක් සඳහා සම්මාන සාමාර්ථ (C) හෝ ඉහළ ශ්‍රේණි ලබා තිබිම.
- ඉහත ප්‍රතිඵල දෙවතාවකදී ලබා තිබිය හැකිය.
- මෙම ප්‍රතිඵල දෙවතාවකදී ලබා ඇත්නම්, පළමු වරදී මව් භාෂාව සහ ගණිතය ඇතුළු මූලික විෂයයන් පහක් සමත් වි තිබිය යුතු අතර අවම වශයෙන් (ඕනෑම) විෂයයන් තුනක් සඳහා සම්මාන (C) හෝ ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුය.

### 4) ඉගෙනුම් ඵල

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව,

- විවිධ අවශ්‍යතා සහ අරමුණු සහිත පුද්ගලයන්ට සේවය කිරීම සඳහා පුස්තකාල ක්‍රියාත්මක වන ආකාරය නිදර්ශනය කිරීමට
- සාමාන්‍ය පුස්තකාල කාර්යයන් සම්පූර්ණ කිරීමට
- ප්‍රධාන තොරතුරු මූලාශ්‍ර හඳුනාගැනීමට
- මූලික සන්නිවේදනය සහ තොරතුරු ලබා ගැනීම සඳහා ICT සහ ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමට
- කියවීම ප්‍රවර්ධනය කිරීමට
- පුස්තකාල බාහිර ක්‍රියාකාරකමක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට

සහභාගිවන්නාට හැකි වනු ඇත

5) **වැඩසටහනේ වැදගත්කම:** අ.පො.ස./උ.පෙළ නොමැති අයට, ACL පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූපයේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන (SLQF Level 3) ඩිප්ලෝමා පාඨමාලා තුනෙන් එකකට ඇතුලත් වී උසස් ඩිප්ලෝමාව (SLQF Level 3)




6) **පාඨමාලාවට අන්තර්ගත විෂයයන්**

1) වෘත්තීය අධ්‍යයන සුදුසුකම
2) පුස්තකාලයාධිපතිත්වය හැඳින්වීම
3) පුස්තකාල කාර්යයන් 1
4) පුස්තකාල කාර්යයන් 2
5) වෛකල්පිත මොඩියුලය / පාසල් හෝ මහජන පුස්තකාල
6) ව්‍යාපෘතිය

7) **පාඨමාලා කාලය :** මාස 06

8) **මාධ්‍ය -** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී).

9) **පන්ති පැවැත්වීම :** නැවත දැනුම් දෙනතුරු සියලුම පන්ති මාර්ගගතව (Online) පැවැත්වේ

10) **ඇගයීම් ක්‍රමවේදය**
සෑම විෂයක් සඳහාම ලබාදෙන ඇගයීම් ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම මගින්.

11) **පුස්තකාලයාධිපතිත්ව සහතිකපත්‍රය ලබා ගැනීමට නම්**
පුස්තකාලයාධිපතිත්ව සහතිකපත්‍රය ලබා ගැනීමට නම් පාඨමාලාලාභීන් සෑම විෂයයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය.

12) **පාඨමාලා ගාස්තු:** රු.16,000/= ( එක් වාරිකයකින් ගෙවිය යුතුය)

13) **අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය :** 31 මැයි 2022

14) **වැඩසටහන් ආරම්භය:** 2022 ජූලි මස

15) **අයදුම් කරන ආකාරය**

1. අයදුම්පත්‍රය අපගේ වෙබ් අඩවියෙන් **(https://nilis.cmb.ac.lk/home/)** බාගත කරන්න.
2. අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න
3. අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු. 250.00 ක මුදලක් මහජන බැංකුව තිඹිරිගස්යාය ශාඛාවේ **086100101191736** අංක දරණ ගිණුමට බැර කර මුල් ලදුපත අයදුම් පත්‍රයේ ලබා දී ඇති කොටුවේ අලවන්න.
4. ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, සහ අ.පො.ස./සා.පෙළ සහතිකයේ, සහතික කළ පිටපත් අමුණන්න.
5. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ <u>පාඨමාලා කේතය</u> ලියන්න.
6. අයදුම්පත සහ අනෙකුත් ඇමුණුම් පහත ලිපිනයට තැපැල් කරන්න.

**"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
**ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)**
**කොළඹ විශ්වවිද්‍යාලය**
**කොළඹ 03"**